පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

අවසාන වාර පරීක්ෂණය - 2017

පාසලේ නම : ..............................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ................................................
..................................................................................................................

කාලය : පැය 03 යි.

# ලංකා ඉතිහාසය I

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි. ව. 1978 දක්වා**

**සැලකිය යුතුයි :**

❖ **මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

- **ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නාම පහ බැගින් දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හේතුවක් නිසා අනෙක් නම සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන, එහි අංකය වරහන් තුළ ලියන්න.**

01. (1) තම්මාර දෙවියා (2) චිත්තරාජ (3) කාලවේල
(4) චේතියා (5) වලවාමුඛී (............)

02. (1) නන්දිමිත්‍ර (2) වේළුසුමන (3) සුරනිමල
(4) දීඝජන්තු (5) ඵුස්සදේව (............)

03. (1) තැප්‍රොබේන් (2) පලෙසිමුන්ඩු (3) සෙරන්ඩිබ්
(4) ජනනාළු - මංගලම් (5) සෙයිලාන් (............)

04. (1) මාතොට (2) ඌරාතොට (3) ගෝකණ්ණ
(4) ජම්බුකොලපට්ටාන (5) කසාතොට (............)

05. (1) තෝණිගල ගිරි ලිපිය (2) අඹගමුව ලිපිය (3) දෙවනගල ලිපිය
(4) සංගමු විහාර ලිපිය (5) ගල් විහාර ලිපිය (............)

Education NCP - www.edncp.lk

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතරින් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

06. (1) ගමක පාලනය පිළිබඳ වූ නීතිරීති - කොන්ඩවට්ටවාන් සෙල්ලිපිය
(2) වෙළෙඳ නගරයක පාලනය සඳහා වූ නීතිරීති - බදුලු ටැම් ලිපිය
(3) වැවකින් ජලය බෙදාහැරීමේ නීතිරීති - වෙස්සගිරිය පුවරු ලිපිය
(4) විහාරගම් පාලනය සඳහා වූ නීතිරීති - වේවැල්කැටිය සෙල්ලිපිය
(5) භික්ෂූන් සඳහා වූ උපදෙස් හා නීතිරීති - කළුදිය පොකුණ සෙල්ලිපිය (............)

07. (1) කාකවණ්ණ තිස්ස රජතුමා - විහාර මහා දේවිය
(2) කුටකණ්ණ තිස්ස රජතුමා - අනුලා දේවිය
(3) පළමුවැනි විජයබාහු රජතුමා - තිලෝකසුන්දරී
(4) පළමුවැනි විමලධර්මසූරිය රජතුමා - කුසුමාසන දේවිය
(5) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා - වෙන්කට රංගම්මා (............)

08. (1) මහින්ද රජතුමා - දේවානම්පියතිස්ස රජතුමා
(2) හේමමාලා දන්ත කුමරු - සිරිමේඝවණ්ණ රජතුමා
(3) බුද්ධඝෝෂ හිමි - බුද්ධදාස රජතුමා
(4) ෆාහියන් - මහානාම රජතුමා
(5) උපාලි හිමි - කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (............)

09. (1) කාලවාපි - වසභ රජතුමා
(2) මණිහිරවාපි - මහසෙන් රජතුමා
(3) පත්තපාසණවාපි - දෙවන මොග්ගල්ලාන රජතුමා
(4) ගිරිතටවාපි - දෙවන අග්ගබෝධි රජතුමා
(5) තබ්බවාපි - දෙවන උදය රජතුමා (............)

10. (1) උපතිස්ස ග්‍රාම - කදම්බ නදී
(2) උරුවෙල ග්‍රාම - ගෝණ නදී
(3) කාචර ගාම - කප්පකන්දර නදී
(4) විජිත ගාම - මහාවාලුකා නදී
(5) දීඝගාම - කල්‍යාණි නදී (............)

Education NCP - www.edncp.lk

- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරුව X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන් තුළ ලියන්න.

11.

| | X | | Y |
|---|---|---|---|
| (i) | කදම්භ නදී | A | දැදුරු ඔය |
| (ii) | ගෝණ නදී | B | මැණික් ගඟ |
| (iii) | ජජ්ජර නදී | C | මල්වතු ඔය |
| (iv) | වන නදී | D | කලාඔය |
| (v) | කප්පකන්දර නදී | E | වලවේ ගඟ |

(1) EDABC (2) DEACB (3) CBDAE
(4) CDAEB (5) BEADC (............)

12.

| | X | | Y |
|---|---|---|---|
| (i) | දුට්ඨගාමිණී | A | රවිදේව |
| (ii) | වට්ඨගාමිණී අභය | B | කපිසීස |
| (iii) | ධාතුසේන | C | නන්දිමිත්‍ර |
| (iv) | පළමුවන විජයබාහු රජතුමා | D | මිගාර |
| (v) | පළමුවන පරාක්‍රමබාහු රජතුමා | E | ලංකාපුර |

(1) EDABC (2) DEACB (3) CBDAE
(4) CDAEB (5) BEADC (............)

Education NCP - www.edncp.lk

13.

| | X | | Y |
|---|---|---|---|
| (i) | සිරිමේඝවර්ණ රජතුමා | A | පනාකඩුව තඹ සන්නස |
| (ii) | හතරවන උදය රජතුමා | B | දෙවනගල සෙල්ලිපිය |
| (iii) | පළමුවැනි විජයබාහු රජතුමා | C | ගල්පොත සෙල්ලිපිය |
| (iv) | පළමුවැනි පරාක්‍රමබාහු රජතුමා | D | හෝපිටිගමුව ටැම් ලිපිය |
| (v) | නිශ්ශංකමල්ල රජතුමා | E | තෝනිගල සෙල්ලිපිය |

(1) EDABC (2) DEACB (3) CBDAE
(4) CDAEB (5) BEADC (............)

14.

| | X | | Y |
|---|---|---|---|
| (i) | ඩිමුන්ඩෝ | A | ප්‍රකෝපියස් |
| (ii) | ටොමෝග්‍රැෆියා ක්‍රිස්ටියානා | B | රොබට් නොක්ස් |
| (iii) | පර්සියන් යුද්ධය | C | ක්වේරෝෂ් |
| (iv) | එදා හෙළදිව | D | කොස්මස් |
| (v) | ලංකාධිපත්‍යය | E | ඇරිස්ටෝටල් |

(1) EDABC (2) DEACB (3) CBDAE
(4) CDAEB (5) BEADC (............)

15.

| | X | | Y |
|---|---|---|---|
| (i) | සූරතිස්ස | A | ශ්‍රී මාර ශ්‍රී වල්ලභ |
| (ii) | වංකනාසිකතිස්ස | B | I රාජරාජ |
| (iii) | I සේන | C | I පරාන්තක |
| (iv) | IV උදය | D | සේන ගුත්තික |
| (v) | V මිහිඳු | E | කරිකාලචෝල |

(1) EDABC (2) DEACB (3) CBDAE
(4) CDAEB (5) BEADC (............)

Education NCP - www.edncp.lk

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් සෑම ප්‍රශ්නයකටම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

16. පුරාණ ශ්‍රී ලංකාවේ නිර්මාණය කරන ලද වැව්වල අනුපිළිවෙළ අඩංගු වන්නේ කවර වරණයේ ද?

(1) බසවක්කුලම වැව, මින්නේරිය වැව, නාච්චාදූව වැව, කන්තලේ වැව, පරාක්‍රම සමුද්‍රය

(2) බසවක්කුලම වැව, මින්නේරිය වැව, පරාක්‍රම සමුද්‍රය, නාච්චාදූව වැව, කන්තලේ වැව

(3) මින්නේරිය වැව, බසවක්කුලම වැව, කන්තලේ වැව, නාච්චාදූව වැව, පරාක්‍රම සමුද්‍රය

(4) බසවක්කුලම වැව, කන්තලේ වැව, මින්නේරිය වැව, නාච්චාදූව වැව, පරාක්‍රම සමුද්‍රය

(5) බසවක්කුලම වැව, නාච්චාදූව වැව, මින්නේරිය වැව, කන්තලේ වැව, පරාක්‍රම සමුද්‍රය (............)

17. ශ්‍රී ලංකාවේ ඉතිහාසය සම්බන්ධ පහත දැක්වෙන මූලාශ්‍ර රචිත කාලය අනුව ඒවායේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ කවර වරණයේ ද?

(1) දීප වංශය, මහා වංශය, පූජාවලිය, වංසත්තප්පකාසිනි, රාජාවලිය

(2) දීප වංශය, පූජාවලිය, මහා වංශය, වංසත්තප්පකාසිනි, රාජාවලිය

(3) දීප වංශය, මහා වංශය, වංසත්තප්පකාසිනි, පූජාවලිය, රාජාවලිය

(4) දීප වංශය, මහා වංශය, වංසත්තප්පකාසිනි, රාජාවලිය, පූජාවලිය

(5) මහා වංශය, දීප වංශය, වංසත්තප්පකාසිනි, පූජාවලිය, රාජාවලිය (............)

18. රෝහණ රාජ්‍යයේ පාලකයන්ගේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත සඳහන් කවර වරණයේ ද?

(1) මහානාග, යටාලතිස්ස, ගෝඨාභය, කාවන්තිස්ස, දුටුගැමුණු

(2) ගෝඨාභය, මහානාග, යටාලතිස්ස, කාවන්තිස්ස, දුටුගැමුණු

(3) මහානාග, ගෝඨාභය, යටාලතිස්ස, කාවන්තිස්ස, දුටුගැමුණු

(4) මහානාග, යටාලතිස්ස, කාවන්තිස්ස, දුටුගැමුණු, ගෝඨාභය

(5) යටාලතිස්ස, කාවන්තිස්ස, දුටුගැමුණු, ගෝඨාභය, මහානාග (............)

19. අනුරාධපුර යුගයේ ඉදිකළ ස්ථූපවල නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත සඳහන් කවර වරණයේ ද?

(1) ථූපාරාම දාගැබ, මිරිසවැටි දාගැබ, රුවන්වැලිසෑය, අභයගිරි දාගැබ, ජේතවන දාගැබ

(2) ථූපාරාම දාගැබ, රුවන්වැලිසෑය, අභයගිරි දාගැබ, මිරිසවැටි දාගැබ, ජේතවන දාගැබ

(3) ථූපාරාම දාගැබ, මිරිසවැටි දාගැබ, අභයගිරි දාගැබ, රුවන්වැලිසෑය, ජේතවන දාගැබ

(4) ථූපාරාම දාගැබ, අභයගිරි දාගැබ, මිරිසවැටි දාගැබ, රුවන්වැලිසෑය, ජේතවන දාගැබ

(5) ථූපාරාම දාගැබ, ජේතවන දාගැබ, මිරිසවැටි දාගැබ, අභයගිරි දාගැබ, රුවන්වැලිසෑය (............)

Education NCP - www.edncp.lk

20. ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණවල අනුපිළිවෙළ දැක්වෙන්නේ පහත සඳහන් කුමන ලැයිස්තුවේ ද?

(1) සේන හා ගුත්තික, එළාර, පස් ද්‍රවිඩ, සත් ද්‍රවිඩ, පළමුවන රාජරාජ

(2) සේන හා ගුත්තික, එළාර, සත් ද්‍රවිඩ, පස් ද්‍රවිඩ, පළමුවන රාජරාජ

(3) එළාර, සේන හා ගුත්තික, පස් ද්‍රවිඩ, සත් ද්‍රවිඩ, පළමුවන රාජරාජ

(4) එළාර, සේන හා ගුත්තික, පළමුවන රාජරාජ, පස් ද්‍රවිඩ, සත් ද්‍රවිඩ

(5) සේන හා ගුත්තික, එළාර, පළමුවන රාජරාජ, පස් ද්‍රවිඩ, සත් ද්‍රවිඩ (............)

- **ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. වාරි කර්මාන්තය,

(1) මුල්ම වාරි කර්මාන්තය ගම් වැව් නිර්මාණය කිරීමත් සමඟ ආරම්භ විය.

(2) තිසාවැව දේවානම්පියතිස්ස රජු විසින් කරවන ලදැයි සැලකේ.

(3) ලොකු වැව් නිර්මාණය කිරීම වසභ රාජ්‍ය සමයේ ආරම්භ විය.

(4) පුරාණ වාරි කර්මාන්තවල වර්ධනයේ උච්චතම අවස්ථාව සමුද්‍ර වාපියෙන් සලකුණු කෙරේ.

(5) සියලු වැව් ගංගා වලින් පෝෂණය වේ. (............)

22. පළමුවන විජයබාහු රජතුමා,

(1) පළමුවැනි විජයබාහු රජතුමා ළාබාල අවධියේ කිත්ති කුමරු ලෙස හැඳින්විය.

(2) බුද්ධරාජ නම් ජන ප්‍රධානියෙකු පළමුවැනි විජයබාහු රජතුමාට ආධාර කළේ ය.

(3) චෝලයන් ශ්‍රී ලංකාවෙන් පළවා හැර පළමු වැනි විජයබාහු රජතුමා දිවයින එක්සේසත් කළේ ය.

(4) පළමුවැනි විජයබාහු රජතුමා රාමඤ්ඤ දේශය ආක්‍රමණය කළේ

(5) පළමුවැනි විජයබාහු රජතුමා පොළොන්නරුව සිය අගනුවර කරගත්තේ ය. (............)

23. ජේතවනාරාමය,

(1) ජේතවනාරාමය මහසෙන් රජු විසින් කරවන ලදී.

(2) ජේතවනාරාමය මහා විහාර සීමාව තුළ පිහිටුවන ලදී.

(3) සාගල භික්ෂුවට ජේතවනාරාමය පූජා කරන ලදී.

(4) ජේතවන දාගැබ ලංකාවේ විශාලතම ස්ථූපය විය.

(5) ජේතවන නිකාය, ජේතවන විහාරය කේන්ද්‍ර කරගනිමින් ආරම්භ විය. (............)

Education NCP - www.edncp.lk

24. වළගම්බා රජතුමා මුහුණ දුන් අභියෝග,

(1) තීය බමුණා විසින් ඇති කරන ලද කැරැල්ල

(2) බැමිණිතියා සාය

(3) සත් ද්‍රවිඩ ආක්‍රමණ

(4) කපිසීසගේ මරණින් පසු සෙන්පතිවරු වළගම්බා රජු අතහැර යාම

(5) මාඝගේ ආක්‍රමණ (............)

25. ශ්‍රී ලංකාවට බුද්ධාගම හඳුන්වා දීම,

(1) තුන්වන ධර්ම සංගායනාව

(2) මිහිඳු මාහිමියන්ගේ ලංකාගමන

(3) සංඝමිත්තා තෙරණියගේ වැඩම වීම

(4) මහානාග යුවරජු පැවිදි වීම

(5) මහ මෙව්නා උයන සඟ සතු කිරීම (............)

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ඇති එක් එක් ප්‍රශ්නය සඳහා දක්වා ඇති (A) (B) (C) සහ (D) යන ප්‍රතිචාර අතුරින් එකක් හෝ කීපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**

| | |
|---|---|
| **(A) සහ (B) පමණක් නිවැරදි නම්** | **1 ද** |
| **(B) සහ (C) පමණක් නිවැරදි නම්** | **2 ද** |
| **(C) සහ (D) පමණක් නිවැරදි නම්** | **3 ද** |
| **(A) සහ (C) පමණක් නිවැරදි නම්** | **4 ද** |
| **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම්** | **5 ද** |

**වරහන් තුළ ලියන්න.**

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A) සහ (B) පමණක් නිවැරදිය** | **(B) සහ (C) පමණක් නිවැරදිය** | **(C) සහ (D) පමණක් නිවැරදිය** | **(A) සහ (C) පමණක් නිවැරදිය** | **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය** |

Education NCP - www.edncp.lk

26. ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස පිහිටුවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) ඉන්දියාවේ ප්‍රදේශ කීපයකින් පැමිණි සංක්‍රමණික පිරිස් විසින් මුල් ජනාවාස පිහිටවනු ලැබීය.

(B) මුල් ජනාවාස ගංගා නිම්න ආශ්‍රිත ව පිහිටුවන ලදී.

(C) මුල්ම ජනාවාසය, පණ්ඩුකාභය රාජ්‍ය සමයේ පිහිටුවන ලැබීය.

(D) ආදීතම යුගයේ දී ඉන්දියාව හා ලංකාව අතර වෙළෙඳ සබඳතා කිසිවක් නොවීය. (............)

27. ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වය සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ මෞර්ය අභිෂේක ක්‍රමය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී.

(B) රාජ්‍යත්වයේ උරුමය මුළුමනින් ම පියාගෙන් පුතාට මාරු විය.

(C) භූපති නම් විරුදය රජවරුන් සඳහා භාවිත විය.

(D) අනුරාධපුර යුගයේ දී කිසිදු කාන්තාවක් රාජ්‍යත්වයට පත් නොවීය. (............)

28. පොලොන්නරු යුගයේ බිඳවැටීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) චන්ද්‍රභානුගේ ආක්‍රමණයෙන් සිදු වූ විනාශය

(B) සාගත

(C) කාලිංග පාණ්ඩ්‍ය පෙළපත් අතර ගැටුම්

(D) දුර්වල පාලකයන් බලයට පත් වීම (............)

29. රෝහණය එක්සේසත් කිරීමට කාවන්තිස්ස රජතුමා අනුගමනය කළ ක්‍රියාමාර්ග,

(A) විවාහ සබඳතා

(B) යුධමය ක්‍රියාමාර්ග මඟින් යටත් කරගැනීම

(C) ආගමික ක්‍රියාමාර්ග

(D) වරපුරුෂ සේවය (............)

30. පැරණි ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) පොළොන්නරු යුගයේ දී ශ්‍රී ලංකාව හා යුරෝපය අතර සෘජු වාණිජ සබඳතා පැවතුණි.

(B) ආරම්භයේ පටන් ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියාව අතර සමීප වෙළෙඳ සබඳතා පැවතුණි.

(C) අනුරාධපුර යුගයේ දී මහාතිත්ථ වරාය වැදගත් වරායක් විය.

(D) රෙදිපිළි, අශ්වයින් සහ පිඟන් භාණ්ඩ කෝට්ටේ අවධියේ දී චීනයට අපනයනය කරන ලදී. (............)

Education NCP - www.edncp.lk

- **ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

31. මහා වංශයට අනුව විජය රජතුමාගේ අගනුවර කුමක් ද?

(1) සිරසවත්ථුපුර (2) අනුරාධපුරය (3) ලංකාපුරය

(4) උපතිස්ස ග්‍රාම (5) තම්බපණ්ණි (............)

32. ලම්භකර්ණ පෙළපතේ ආරම්භක පාලකයා කවුද?

(1) සුභ (2) වසභ (3) ගජබාහු

(4) ගෝඨාභය (5) ධාතුසේන (............)

33. පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ රාමඤ්ඤ දේශය ආක්‍රමණය පිළිබඳ ව සඳහන් වන සෙල්ලිපිය කුමක් ද?

(1) තිරුවලංගාඩු සෙල්ලිපිය (2) අඹගමුව සෙල්ලිපිය (3) ගල් විහාර සෙල්ලිපිය

(4) දෙවනගල සෙල්ලිපිය (5) රාමේෂ්වරම් සෙල්ලිපිය (............)

34. මාගම පළමුවැනි පාලකයා කවුරුන් ද?

(1) උත්තිය (2) මහාසිව (3) සූරතිස්ස

(4) මහානාග (5) අසේල (............)

35. නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග කවරේ ද?

(1) චෝල ආක්‍රමණය (2) ගොවි වංශිකයන්ගෙන් එල්ල වූ අභියෝග

(3) තීය බමුණාගේ කැරැල්ල (4) යාපනය පාලකයන්ගෙන් එල්ල වූ අභියෝග

(5) චන්ද්‍රභානු ආක්‍රමණය (............)

- **ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා, ඊට අදාළ අංකය වරහන් තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය | වැරදි ය |
| 2 | නිවැරදි ය | නිවැරදි ය |
| 3 | වැරදි ය | වැරදි ය |
| 4 | වැරදි ය | නිවැරදි ය |
| 5 | නිවැරදි ය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි |

Education NCP - www.edncp.lk

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | පළමුවැනි නිකාය භේදය සද්ධාතිස්ස රාජ්‍ය සමයේ සිදුවිය | සංඝ සංවිධානය තුළ එක්සත් බවක් ඇති කළ පළමුවැනි විජයබාහු රජතුමා කතිකාවතක් හෙවත් විනය ව්‍යවස්ථා මාලාවක් ප්‍රකාශයට පත් කළේ ය. | (............) |
| 37. | බදුල්ල ටැම් ලිපිය වෙළෙඳ ගමක පාලනය පිළිබඳ නීතිරීති වාර්තා කරයි. | සත්මහල් ප්‍රාසාදය නිශ්ශංකමල්ල රජතුමා විසින් කරවන ලදැයි විශ්වාස කෙරේ. | (............) |
| 38. | දීපවංශය ලංකාවේ පැරණිතම වංශ කතාවයි. | දීපවංශය යනු අභයගිරි විහාරයේ වංශ කතාවයි. | (............) |
| 39. | පනාකඩුව තඹ සන්නස පළමුවන විජයබාහු රජතුමා සහ දෙවන ගජබා රජතුමා අතර ඇති වූ ගිවිසුම වාර්තා කරයි. | පොළොන්නරු යුගයේ විශාල සෙල්ලිපි ප්‍රමාණයක් කරවූ පාලකයා පළමු වැනි පරාක්‍රමබාහු රජතුමා ය. | (............) |
| 40. | මිහිඳු මාහිමියන් සහ එම පිරිසේ තවත් තිදෙනෙකු පිළිබඳ ව ක්‍රි. ව. පළමුවැනි සියවසට පමණ අයත් මිහින්තලේ සෙල්ලිපියේ සඳහන් වේ. | මේ අනුව මිහිඳු හිමිගේ ප්‍රධාන ධර්ම දූත පිරිස විසින් ශ්‍රී ලංකාවේ බුදු සසුන පිහිටුවන ලද්දේ ය යන වෘතාන්තය බුදු සසුන පිහිටුවනු කාලයට අවුරුදු 300 කට පමණ පසු ලියන ලද සෙල්ලිපි කීපයකින් තහවුරු වේ. | (............) |

Education NCP - www.edncp.lk

***

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 12

# අවසාන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ..............................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..............................................

.............................................................................................................. කාලය : පැය 03 මි. 10 යි.

## ලංකා ඉතිහාසය (25) - I පත්‍රය

**සැලකිය යුතුයි :**

- ❖ මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ❖ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහ බැගින් දී ඇති නමුත් නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- ❖ මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.
- ❖ කොටස් දෙකටම මුළු කාලය පැය 03 මි. 10 කි. පිළිතුරු ලියා අවසන් වූ පසු I කොටස, II කොටසේ පිළිතුරුපත් සමඟ අමුණා භාරදෙන්න.

## I කොටස

- අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

01. (1) ගම්භීර නදී (2) වන නදී (3) කාවේරි නදී
(4) කදම්බ නදී (5) ජජ්ජර නදී (................)

02. (1) අලිගල (2) පාහියන්ගල (3) බටදොඹ ලෙන
(4) ඉබ්බන්කටුව (5) පොතාන (................)

03. (1) මදෙහස (2) ගමික (3) රධික
(4) පරුමක (5) පරුමකලු (................)

04. (1) ථූප වංශය (2) දීප වංශය (3) මහා වංශය
(4) ධාතු වංශය (5) මෞර්ය වංශය (................)

05. (1) මහාතිත්ථ (2) කච්ඡතිත්ථ (3) ගෝකණ්ණතිත්ථ
(4) සූකරතිත්ථ (5) ගිම්හතිත්ථ (................)

06. (1) පුංඛ ගාම (2) අනුරාධපුරය (3) පොළොන්නරුව
(4) කුරුණෑගල (5) දඹදෙණිය (................)

07. (1) සරජෝතිමාලෛයි (2) සද්ධර්මරත්නාවලිය (3) පූජාවලිය
(4) කවිසිළුමිණ (5) සමන්තකූටවණ්ණනා (................)

Education NCP - www.edncp.lk

08. (1) ගල්ඔය ව්‍යාපාරය (2) මින්නේරි ව්‍යාපාරය (3) නාච්චාදූව ව්‍යාපාරය
(4) ඉරණමඩු ව්‍යාපාරය (5) පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරය (................)

09. (1) විහාර මහා දේවී (2) රත්නාවලී (3) කළ්‍යාණිවතී
(4) සුනේත්‍රාදේවී (5) සමුද්‍රදේවී (................)

10. (1) උපෝසථඝර (2) චේතියඝර (3) ප්‍රතිමාඝර
(4) බෝධිඝර (5) සූතිඝර (................)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එය නොගැළපෙන යුගල කුමක්දැයි හඳුනාගෙන, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11. (1) කදම්බ නදී - මල්වතු ඔය
(2) මහා නදී - දැදුරු ඔය
(3) වන නදී - වලවේ ගඟ
(4) කප්පකන්දර නදී - මැණික් ගඟ
(5) ගෝණනදී - කලාඔය (................)

12. (1) I වන පරාක්‍රමබාහු - ෂඩ් භාෂා පරමේශ්වර
(2) II පරාක්‍රමබාහු - කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත
(3) නිශ්ශංකමල්ල - කාලිංග චක්‍ර වර්ති
(4) මහසෙන් - මින්නේරි දෙවියන්
(5) II සේන - මදුරපතල සිරිසඟබෝ (................)

13. (1) ගාමභෝජක - ගමික
(2) භාණ්ඩාගාරික - බඩගරික
(3) නගර ගුත්තික - දකපති
(4) මහාමච්ච - මහමත
(5) දෞවාරික - දොරතන (................)

14. (1) තිසාවැව - අනුරාධපුර දිස්ත්‍රික්කය
(2) තෝපාවැව - කුරුණෑගල දිස්ත්‍රික්කය
(3) පරාක්‍රම සමුද්‍රය - පොළොන්නරුව දිස්ත්‍රික්කය
(4) සේනානායක සමුද්‍රය - අම්පාර දිස්ත්‍රික්කය
(5) යෝධ වැව - මන්නාරම දිස්ත්‍රික්කය (................)

15. (1) කාවන්තිස්ස රජු - විහාරමහා දේවි
(2) වලගම්බා රජු - සෝමාවති දේවි
(3) I විජයබාහු රජු - තිලෝක සුන්දරි දේවි
(4) I පරාක්‍රමබාහු රජු - සුනේත්‍රා දේවි
(5) නිශ්ශංකමල්ල රජු - කළ්‍යාණවති දේවි (................)

Education NCP - www.edncp.lk

- අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවල X තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු සමූහය Y තීරුව සමඟ ගළපා නිවැරදි පිළිතුරට අදාළ සංයෝගයේ ඇති අංකය වරහන තුළ ලියන්න.

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | බෝධි ශාඛාව | A | දේවානම්පියතිස්ස රජු |
| 2. | දළදාව | B | I ගජබා රජු |
| 3. | ධම්ම ධාතුව | C | සිරිමේඝවර්ණ රජු |
| 4. | කේශ ධාතුව | D | ශිලාකාල රජු |
| 5. | පත්තිනි ඇදහිල්ල | E | පළමුවන මුගලන් රජු |

(1) ABCDE (2) ACBDE (3) ACDEB
(4) ACBED (5) ADECB (................)

17.

| | X | | Y |
|---|---|---|---|
| 1. | පණ්ඩුවාසදේව | A | අභයවැව ඉදිකිරීම |
| 2. | පණ්ඩුකාභය | B | උපතිස්ස ග්‍රාමය පාලන මධ්‍යස්ථානය |
| 3. | දුට්ඨගාමිණී | C | තීය බමුණාගේ කැරැල්ල |
| 4. | වට්ටගාමිණී | D | එළාරගේ ආධිපත්‍යයෙන් රජරට මුදවා ගැනීම |
| 5. | වසභ | E | පළමුවන ලම්භකර්ණ පෙළපොත |

(1) BADCE (2) BACDE (3) BCADE
(4) BRDAC (5) BCEAD (................)

18.

| | X | | Y |
|---|---|---|---|
| 1. | හත්තොට අමුණ | A | වළවේ ගඟ |
| 2. | ඇළහැර අමුණ | B | අඹන් ගඟ |
| 3. | මිණිපේ අමුණ | C | කළු ගඟ |
| 4. | වැන්කැට් අමුණ | D | මහවැලි ගඟ |
| 5. | කොට්ඨබද්ධ අමුණ | E | දැදුරු ඔය |

(1) BEACD (2) CBDAE (3) CDAEB
(4) DEACB (5) CDABC (................)

19.

| | X | | Y |
|---|---|---|---|
| 1. | රුවන්වැලි සෑ පුවරු ලිපිය | A | පළමුවන විජයබාහු රජු |
| 2. | ගල්පොත ලිපිය | B | හත්වන බුවනෙකබා රජු |
| 3. | දැදිගම පුවරු ලිපිය | C | දෙවන පරාක්‍රමබාහු රජු |
| 4. | දඹදෙණි කතිකාවත | D | නිශ්ශංකමල්ල රජු |
| 5. | පනාකඩුව තඹ සන්නස | E | කල්‍යාණවති රැජින |

(1) EDCBA (2) ECBAD (3) EBADC
(4) EADCB (5) EDBCA (................)

20.

| | X | | Y |
|---|---|---|---|
| 1. | දේවානම්පියතිස්ස රජු | A | හිස දන්දීම |
| 2. | අසේල රජු | B | ගල්විහාර ලිපිය |
| 3. | සිරිසඟබෝ රජු | C | ලක්දිව බොදු සසුන පිහිටවීම |
| 4. | I පරාක්‍රමබාහු රජු | D | ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයෙකි |
| 5. | බුද්ධදාස රජු | E | එළාර ආක්‍රමණය |

(1) CABED (2) CBDEA (3) CDEAB
(4) CEABD (5) CEBAD (................)

Education NCP - www.edncp.lk

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. අනුරාධපුර රාජධානියේ පාලනය,
    (1) රජතුමා සමස්ත පරිපාලන යාන්ත්‍රණයේම කේන්ද්‍රය විය.
    (2) අනුරාධපුර සියලුම රජවරු මෞර්ය පෙළපතට අයත් වූහ.
    (3) න්‍යායාත්මකව රජතුමා යුක්ති ධර්මයේ උල්පත විය.
    (4) න්‍යායාත්මකව රජතුමා භූපති ලෙස පිළිගැනෙති.
    (5) රජුගේ ප්‍රධාන ආදායම වූයේ ඉඩම් ය. (................)

22. සීගිරිය,
    (1) සීගිරියේ ඓතිහාසික යුගය බුදු සමය හඳුන්වා දුන් අවධිය දක්වා යයි.
    (2) සීගිරියේ ඇති ලෙන් ලිපිවලින් අතීතයේ සිට භික්ෂූන් වැඩ සිටි බවට සාක්ෂි ඇත.
    (3) සීගිරියේ වඩාත්ම කැපී පෙනෙන්නේ බිතු සිතුවම් ය.
    (4) සීගිරිය ධාතුසේන රජුගේ අගනුවර විය.
    (5) සීගිරියේ ජල උද්‍යාන අතීත උද්‍යාන අලංකරණයට හොඳ උදාහරණයකි. (................)

23. ඉතිහාසය ගෘහයක් ලෙස හඳුන්වන්නේ,
    (1) එහි ඉතිහාසය හා සියලු විෂයන් අඩංගු වන නිසා ය.
    (2) එහි ඉතිහාසය හා දේශපාලන විෂය අඩංගු වන නිසා ය.
    (3) එහි ඉතිහාසය හා ආගමික විෂය අඩංගු වන නිසා ය.
    (4) එහි ඉතිහාසය හා තර්ක ශාස්ත්‍රය අඩංගු වන නිසා ය.
    (5) එහි ඉතිහාසය හා සියලු විෂයන් අඩංගු නොවන නිසා ය. (................)

24. උපෝසථඝර,
    (1) උපෝසථඝර ආසනඝර නමින් ද හඳුන්වනු ලැබේ.
    (2) භික්ෂූන් පොහොය කිරීම සඳහා මෙහි රැස්වූහ.
    (3) භික්ෂූන් නොයෙක් සංඝකර්ම මෙහි පැවැත්වූහ.
    (4) ලෝවා මහා ප්‍රසාදය මෙම වර්ගයට අයත් ගොඩනැගිල්ලකි.
    (5) රත්න ප්‍රාසාදය ද උපෝසථඝරයකි. (................)

25. චෝල ආක්‍රමණ,
    (1) දිවයිනේ උතුරු කොටස මුම්මඩි ශෝල මණ්ඩලම් නමින් හැඳින්වීම.
    (2) පොළොන්නරුව ජනනාථ මංගලම් ලෙස හැඳින්වීම.
    (3) අනුරාධපුරය චෝල පාලකයන්ගේ අගනුවර විය.
    (4) රෝහණය චෝල පාලනයට එරෙහිව ක්‍රියා කළේ ය.
    (5) පළමුවන විජයබාහු රජු චෝලයින් දිවයිනෙන් තෙරපූහ. (................)

Education NCP - www.edncp.lk

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කීපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

| | | |
|---|---|---|
| **(A) සහ (B) පමණක් නිවැරදි නම්** | 01 ද | |
| **(B) සහ (C) පමණක් නිවැරදි නම්** | 02 ද | |
| **(C) සහ (D) පමණක් නිවැරදි නම්** | 03 ද | |
| **(A) සහ (C) පමණක් නිවැරදි නම්** | 04 ද | |
| **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම්** | 05 ද | **වරහන තුළ ලියන්න.** |

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| **(A) සහ (B) පමණක් නිවැරදිය** | **(B) සහ (C) පමණක් නිවැරදිය** | **(C) සහ (D) පමණක් නිවැරදිය** | **(A) සහ (C) පමණක් නිවැරදිය** | **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය** |

26. ශ්‍රී ලංකාවේ බුදුදහම පිහිටුවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශයන් / ප්‍රකාශ නිවැරදි වේද?
    (A) මිහිඳු හිමියන්ගේ පැමිණීම
    (B) භික්ෂු භික්ෂුනි සසුන් පිහිටුවීම
    (C) මහමෙව්නා උයන සඟයාට පූජා කිරීම
    (D) අනුලා බිසව සසුන් ගතවීම (................)

27. ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස ඇති කිරීම සම්බන්ධයෙන් කවර ප්‍රකාශ / ප්‍රකාශයන් නිවැරදි වේද?
    (A) ආර්යයන් පැමිණියේ ද ඉන්දියාවෙනි.
    (B) ආර්යයන්ගේ නිජබිම චීනයයි.
    (C) ආර්යයන් ගංගා නිම්න ආශ්‍රිතව ජනාවාස පිහිටුවා ගත්හ.
    (D) අනුරාධ ග්‍රාමය ද ආර්යයන් ගේ එක් ජනාවාසයකි. (................)

28. අනුරාධපුර සිට පොළොන්නරුවට අගනුවර මාරු කිරීම සම්බන්ධව කවර ප්‍රකාශ / ප්‍රකාශය නිවැරදි වේද?
    (A) රෝහණ දේශයෙන් එල්ල වන බලපෑම් පාලනය කිරීම
    (B) අනුරාධපුරයට වඩා පොළොන්නරුව මධ්‍යගතව පිහිටීම
    (C) මායා රටින් ආක්‍රමණ එල්ල වීම
    (D) මෞර්ය හා ලම්භකර්ණ පෙළපත් අතර ගැටුම (................)

29. ශ්‍රී ලංකාවේ භූගෝලීය පසුබිම සම්බන්ධයෙන් කවර ප්‍රකාශ / ප්‍රකාශයන් නිවැරදි වේද?
    (A) ත්‍රිකුණාමලය වරාය ලෝකයේ සුරක්ෂිත හා ස්වභාවික වරායකි.
    (B) පහතරට තෙත් කලාපය මුල්ම ඓතිහාසික ජනාවාස බිහි විය.
    (C) අභ්‍යන්තර තැනිතලාව ඓතිහාසික ශේෂ කඳුවලින් ද යුක්ත ය.
    (D) අතීතයේ දී රෝහණ දේශය දක්ෂිණ දේශය නමින් හඳුන්වන ලදී. (................)

Education NCP - www.edncp.lk

30. පැරණි ශ්‍රී ලංකාවේ වාණිජ කටයුතු හා සම්බන්ධයෙන් කවර ප්‍රකාශ / ප්‍රකාශයන් නිවැරදි වේද?
(A) පැරණි බ්‍රාහ්මී ලිපිවල වෙළඳුන්ගේ ශ්‍රේණි ගැන සඳහන් වෙති.
(B) අනුරාධපුරයේ දොරටු අසල වෙළෙඳ මධ්‍යස්ථාන තිබුණි.
(C) 'පුරාණ' කාසි ලංකාවේ තිබුණ පැරණි දේශීය කාසි වර්ගයකි.
(D) ශ්‍රී ලංකාව ලෝකයේ වෙනත් රටවල් සමග සබඳතා නොතිබිණි. (................)

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. අමාවතුර නම් ග්‍රන්ථයේ කතුවරයා කවුද?
(1) මේධංකර හිමි (2) සාරිපුත්ත හිමි (3) විද්‍යාචක්‍රවර්ති
(4) ගුරුළුගෝමී (5) පරාක්‍රම පණ්ඩිත (................)

32. වසභ රජුගේ ප්‍රාදේශීය පාලනය ගැන සඳහන් සෙල්ලිපිය කුමක් ද?
(1) කළුදිය පොකුණ සෙල්ලිපිය (2) වල්ලිපුරම් රන් සන්නස
(3) කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය (4) ගල් විහාර ලිපිය
(5) පනාකඩුව තඹ සන්නස (................)

33. VI වන පරාක්‍රමබාහු රජු සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම (2) කෝට්ටේ බෙදා වෙන් කිරීම
(3) කාලිංගමාඝ පරාජය කිරීම (4) චන්ද්‍රභානු පරාජයට පත් කිරීම
(5) පාණ්ඩ්‍ය ආක්‍රමණයක් වැළැක්වීම (................)

34. ඉබන්බතුතා අයත් රට කුමක් ද?
(1) රෝමය (2) චීනය (3) පර්සියානු
(4) ග්‍රීක (5) අරාබි (................)

35. පළමුවන පරාක්‍රමබාහු රජු උපස්ථානයේ ඉදිකළ ස්තූපය කුමක් ද?
(1) ලංකාරාම ස්තූපය (2) මහියංගන ස්තූපය (3) රන්කොත් වෙහෙර
(4) සූතිකාඝර ස්තූපය (5) කිරිවෙහෙර (................)

- **අංක 36 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නවලට ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා, ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

Education NCP - www.edncp.lk

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|
| 36. VI වන පරාක්‍රමබාහු රජු කාලිංග මාඝ පරාජය කළේ ය. | මෙම ජයග්‍රහණයට විජයබාහු හා ජයබාහු කුමාරවරු සහය වූහ. | (.........) |
| 37. I කාශ්‍යප රජු බිඳහෙලිය නොහැකි වූ සීගිරි බලකොටුව සිය රාජධානිය කරගත්තේ ය. | I කාශ්‍යප රජු සීගිරි බලකොටුවේ ආරක්ෂක සංවිධාන ඇති කොට වස්තුව රැස්කොට මනරම් ප්‍රාසාදයක් කරවා කුවේරයා මෙන් වාසය කළේ ය. | (.........) |
| 38. පණ්ඩුකාභය රජු අනුරාධපුරයේ අවු. 70 රාජ්‍ය භොබවන ලදී. | එළාර රජු අවු. 22 ක් අනුරාධපුරය පාලනය කළේ ය. | (.........) |
| 39. පැරණි ලක්දිව අලුත් රජ කෙනෙකු පත් කිරීමේ දී අභිෂේක උත්සවයක් පැවැත්වීය. | සාම්ප්‍රදායික නීතිරීති හා සංස්ථා ආරක්ෂා කිරීම රජු විසින් කළ යුතු විය. | (.........) |
| 40. අභිලේඛනවලට අනුව පත්තපාෂාණවාපි යනු නාච්චාදූව වැවයි. | දෙවන අග්බෝ රජු විසින් මල්වතු ඔය හරස් කොට මෙම වැව ඉදිකරන ලදී. | (.........) |

Education NCP - www.edncp.lk

***

# ලංකා ඉතිහාසය (25) - II පත්‍රය

## II කොටස

**සැලකිය යුතුයි :**

- ❖ **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- ❖ **B හා C කොටස් වලින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න එක බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.**

## A කොටස

01. ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

(1) කඳුරුගොඩ විහාරය (2) දේව නගර
(3) යෝධ වැව (4) මිහින්තලේ (4) මිහිතාගල්කන්ද
(5) ගල්ඔය (6) උඩවළව පළාත
(7) මහනුවර (8) පාහියන්ගල ලෙන
(9) කැළණිය (10) මිණිපේ අමුණ
(11) තම්මැන්නාව (12) ත්‍රිකුණාමලය (ලකුණු 12)

## B කොටස

02. ශ්‍රී ලංකාවේ ඉතිහාසය කෙරෙහි භූගෝලීය සාධක බලපෑ අයුරු පහත දැක්වෙන මාතෘකා ඇසුරින් විස්තර කරන්න.

(i) ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටීම
(ii) ආරක්ෂිත ස්වභාවික වරායන් හිමිව තිබීම
(iii) ගංගාවල වැදගත්කම
(iv) මධ්‍යම කඳුකරය (ලකුණු 16)

03. "ඉතිහාසය හැදෑරීමේ දී මූලාශ්‍ර ලබාදෙන්නේ මහඟු උපකාරයකි"

(i) පොළොන්නරු යුගයේ අවසානය දක්වා ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී උපකාර වන මූලාශ්‍ර ප්‍රභේද (වර්ග) හතර නම් කරන්න. (ලකුණු 04)
(ii) අනුරාධපුරය අවසානය දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී මෙම මූලාශ්‍ර ප්‍රභේදවල වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 12)

04. දුට්ඨගාමිණී හා වට්ටගාමිණී අභය රජවරුන්ගේ දේශපාලන කාර්ය සංසිද්ධීන් සංසන්දනය කරන්න. (ලකුණු 16)

Education NCP - www.edncp.lk

05. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(I) ඉතිහාසය හැදෑරීමේ ප්‍රයෝජන

(II) මධ්‍ය ශිලා යුගය

(III) වසභ රජුගේ වාරි කර්මාන්තය

(IV) I වන විජයබාහු රජුගේ විදේශ ප්‍රතිපත්තිය

(එක් කෙටි සටහනකට ලකුණු 08 බැගින් හිමිවේ.)

(ලකුණු 16)

## C කොටස

06. රජරට ශිෂ්ටාචාරයේ පිරිහීමට තුඩුදුන් හේතු පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 16)

07. දඹදෙණි යුගයේ වැදගත්කම පහත දැක්වෙන තේමා ඇසුරින් පරීක්ෂා කරන්න.

(i) දඹදෙණි රාජධානිය පිහිටුවීම

(ii) දෙවන පරාක්‍රමබාහු රජුගේ කාර්යභාරය

(iii) සංස්කෘතික ප්‍රබෝධය (ලකුණු 16)

08. හයවැනි පරාක්‍රමබාහු රජුගේ දේශපාලන කාර්ය පරීක්ෂා කරන්න. (ලකුණු 16)

09. පහත දැක්වෙන් මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(I) චෝල පාලන සමයේ ශ්‍රී ලංකාවේ දේශපාලන තත්වය


(II) අනුරාධපුර යුගයේ ආර්ථික රටාව

(III) යාපනය රාජධානිය

(IV) ගම්පොළ ප්‍රභූ පවුල් (ලකුණු 16)

Education NCP - www.edncp.lk

***




Education NCP : www.edncp.lk